**අයදුම්පත් භාරගැනීම සතියේ සෑම දිනම පෙ.ව.09.00 සිට ප.ව.03.00 දක්වා පමණි.**

## වාපාර නාම ලියාපදිංචිය සඳහා අයදුම්කරුවන්ට උපදෙස්

**(ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)**

**** ව්‍යාපාරය ලියාපදිංචි අයදුම්පත් කාර්යාලය වෙත භාර දීම සඳහා ව්‍යාපාර අයිතිකරු පැමිණීම අනිවාර්ය වේ.**
****ස්ථිර ලෙස සකසන ලද ව්‍යාපාර නාම පුවරුව ප්‍රදර්ශනය කර තිබීම (නාමය ප්‍රසිද්ධ කිරීම) අනිවාර්ය වේ.**
**** ව්‍යාපාර කටයුතු ආරම්භ කර තිබිය යුතුය.**
**** ව්‍යාපාර කටයුතු ආරම්භ කර දින 14 ක් ඇතුලත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.**
**** ආරම්භක දිනය වසරකට වඩා පෙරදාතම (backdate) කල නොහැක.**
***** අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය.**

**01.ජාතික හැඳුනුම්පත -**

1. ඉල්ලුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර රජයේ සේවකයකු නොවිය යුතුයි.ද්විත්ව පුරවැසිභාවය දරන්නේනම් සනාථ කලයුතු ලියවිලි ඉදිරිපත් කල යුතුයි.
2. ග්‍රාම නිලධාරි සහතික කළ ව්‍යාපාර අයිතිකරුගේ හැඳුනුම්පතෙහි ඡායා පිටපත්.ඊට අමතරව වෙනත් කොට්ඨාශයක පදිංචි නම් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ වසමේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් පදිංචි සහතිකය.(ජාතික හැඳුනුම්පත අස්ථානගත වී ඇත්නම් එකී පුද්ගලයාගේ පදිංචි වසමේ පොලිස් ස්ථානාධිපති වෙතින් ලබාගත් පොලිස් වාර්තාව ඉදිරිපත් කලයුතුයි)ජා.හැ.පත නැවත ලබාගැනිමට පු.ලි.දෙ.වෙත භාර දී ඇත්නම් ඒ බව සනාථ කිරිම සඳහා ග්‍රාම නිලධාරි විසින් සහතික කර නිකුත් කරන ලද කුවිතාංසිය ඉදිරිපත් කල යුතුයි.

**02.**වෙළඳ බලපත්‍රය **-**

නගර සභාවෙන්/ප්‍රාදේශීය සභාවෙන් ගත් වෙළඳ බලපත්‍රයේ පිටපතක් **(ග්‍රාම නිලධාරි සහතික කළ යුතුයි)**

**03.**හවුල් ව්‍යාපාරයක් සඳහා **-**

**හවුල් ගිවිසුම (නිතීඥවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කළ යුතුයි)**

**04.**ආරම්භක ප්‍රාග්ධනය **-**

1. ආරම්භක ප්‍රාග්ධන මුදල සනාථ කිරිම සඳහා ව්‍යාපාරිකයා විසින් විධිමත් දිවුරුම් ප්‍රකාශයක් **(සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කළ යුතුයි)**

**05.**ව්‍යාපාර ස්වභාවය **-**

**(පහත සඳහන් සියලු ලිපි ලේඛන වල පිටපත් ග්‍රාම නිලධාරි විසින් පමණක් සහතික කිරීම අනිවාර්යය වේ.)**

1. ව්‍යාපාර ස්වභාවය වෙළඳාමක්,ආනයන අපනයන කිරිමක් හෝ නිෂ්පාදනයක් නම් වෙළඳාම් කරනු ලබන ආනයන/අපනයන හෝ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ පැහැදිලිව සඳහන් කල යුතුයි.
2. ආයතන සඳහා සේවකයන් සැපයීමේ,සංචාරක ප්‍රවාහන කටයුතු හා වාහන කුලියට ලබා දෙන ස්ථාන සඳහා අයිතිකරු පිලිබඳව අදාල පොලිස් වසමෙන් ලබා ගත්පොලිස් වාර්තාවක් (මුල් පිටපත)
3. ආගන්තුකයින් සඳහා නේවාසික පහසුකම් සැපයීම/කාමර,ගෙස්ට් හවුස් වැනි- එම ස්ථානයේ නීති විරෝධි ක්‍රියාවක් සිදු නොවන බවට අදාල පොලිස් වසමෙන් ලබා ගත් වාර්තාව(මුල් පිටපත)
4. රූපලාවන්‍යාගාර,පච්ච කොටන ස්ථාන, කොණ්ඩා සැකසුම් මධ්‍යස්ථාන හා විලවුන් විකුණන ස්ථාන- පළාත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වාර්තාව,රූපලාවන්‍යාගාර සම්බන්ධයෙන් අදාල පුහුණු සහතික
5. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන- ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිර්දේශය ,ආයුර්වේද වෛද්‍ය සභාවේ ලි.ප.හා වෛද්‍ය සභාව විසින් නිකුත් කල හැඳුනුම්පතේ පිටපත,උපාධි සහතිකය,ආයුර්වේද වෛද්‍යවරයාගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය, එම වෛද්‍යවරයා ජීවතුන් අතර සිටින බවට සනාථ කිරිම,ඖෂධාගාරයක් පැවැත්විමට දෙපාර්තමේන්තුව යටතේ ඇති නිරීක්ෂකයන්ට අනුකූල විම,
6. බටහිර ඖෂධ වෙළඳසැලක් නම්- ඖෂධවේදී සහතිකය,වෛද්‍ය සභාවේ ලියාපදිංචිය,ඖෂධවේදිනියගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය හා හැඳුනුම්පත හා පළාත් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරිගේ අනුමැතිය,බටහිර ඖෂධ සිල්ලරට විකිණීමේ අනුමැතිය
7. බාහිර රෝගී පරීක්ෂණ සායනයක් නම්-පළාත් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරිගේ අනුමැතිය,වෛද්‍ය සභාවේ ලි.ප.සහතිකය,උපාධි සහතිකය
8. වෘත්තිමය කටයුතු හා විශේෂ හැකියාව අවශ්‍ය ව්‍යාපාර සඳහා- එම හැකියාව තහවුරු කරනසහතික
9. පෙර පාසැල් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ(බ.ප.) පෙරපාසැල් ඒකකයේ නිර්දේශය
10. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශය
11. බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණයකරන්නන් (නිෂ්පාදකයන්,අළෙවිකරන්නන් හා ආනයනකරුවන්) සඳහා බීජ පනතේ ලියාපදිංචි වූ සහතිකය
12. ස්වර්ණාභරණ හා මැණික් වෙළඳාම, කැපීම හා අපනයනය- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අනුමැතිය
13. ඉන්ධන පිරවුම්හල්, ටයර්, වාහන සේවා ආයතන, මස් සඳහා සතුන් ඇතිකරන ස්ථාන ,රසායන ද්‍රව්‍ය, සබන්, සායම්,ඉලෙක්ට්‍රෝ ප්ලේටින්, ගැල්වනයිස්, , ඉටිපන්දම් නිෂ්පාදන වැනි ව්‍යාපාර-පාරිසරික ආරක්ෂක බලපත්‍රය
14. යම් ආයතනයක වෙළඳ නියෝජිතයකු නම්-එම ආයතනයේ නියෝජිතයෙකු ලෙස පත්කර ඇති ලිපිය
15. වාහන කුලියට දෙනු ලබන ආයතනයක් /ප්‍රවාහන සේවයක් නම්- වාහන තමා නමින් ඇති බවට සත්‍ය පිටපත් කල පොතේ පිටපත,ලීසිං ආයතනය සතු වේ නම් එම ආයතනයෙන් සත්‍ය පිටපත් කල පොතේ පිටපත / කුලියට ලබා ගත්තේ නම් ඒ බවට ලියවිලි ,වාහන ව්‍යාපාර අයිතිකරු සතු නොවේ නම් අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියහා හැඳුනුම්පත,පොලිස් වාර්තාව

16. ගුවන් විදුලි යන්ත්‍ර ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ කොටස් එකලස් කිරීම- ගුවන් විදුලි සංස්ථාවෙන් ලබාගත් අනුමැතිය
17. මුද්‍රණාලයක් නම්- ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අනුමැතිය
18. පාසැල් ළමුන් ප්‍රවාහනය- ළමාරක්ෂණ අධිකාරියේ පාසැල් ප්‍රවාහන සේවා සහතිකය,සමස්ත ලංකා පාසැල් ළමුන් ප්‍රවාහන සංගමයේ සාමාජික කාඩ්පතේ පිටපතක්
19. පලිබෝධනාශක, කෘමිනාශක හා රසායනික පොහොර අලෙවිය-කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය
20. පාසල් පොත් අලෙවිය- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්ගේ අනුමැතිය
21. සුරතල් මසුන් ඇති කරන ස්ථාන - ජලජ ජීවී සහතිකය

**06.**ව්‍යාපාර ස්ථානය **–(පහත සඳහන් සියලු ලිපි ලේඛන වල පිටපත් ග්‍රාම නිලධාරී විසින් පමණක් සහතික කිරීම අනිවාර්යය වේ.)**

1.පෞද්ගලික අයිතියක් නම්-ඉඩම් ලි.ප.කාර්යාලයේ ලි.ප. කල ඉඩමේ මුල් ඔප්පුවේ ඡායා පිටපතක් අදාල ඔප්පුව යම් බැංකුවක්/මුල්‍ය ආයතනයක් වෙත උකස් කර ඇත්නම් එම ආයතනය විසින් සහතික කල ඔප්පුවේ ඡායා පිටපතක් හා කැමැත්ත ප්‍රකාශිත ලිපිය

2.බදු අයිතියක් නම්, ඉඩම් ලි.ප.කාර්යාලයේ ලි.ප. කල බදු ඔප්පුවේ ඡායා පිටපතක්,ලි.ප.වී නොමැති නම් ලි.ප.සඳහා යැවූ බවට (දිනපොත් අංකය හා යැවූ දිනය ඇතුලත්ව) නීතීඥවරයාගේ ලිපිය

3.ඥාතියෙකුට හිමි ස්ථානයක් නම්- ඉඩමේ මුල් ඔප්පුවේපිටපතක්හා ඉඩම් හිමි ඥාතියාගේ හැඳුනුම්පතේ පිටපතක් ද, අදාල ලිපිනයෙහි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අවසරය දෙන බවට ඉඩම් හිමියාගේප්‍රකාශය,ජීවිත භුක්තියක් ඇත්නම් ජීවිත භුක්තිය හිමිකරුවන්ගෙන්/සම උරුමකරුවන්ගෙන් අදාල ලිපිනයෙහි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අවසරය දෙන බවට ප්‍රකාශය,ඔවුන්ගේ හැඳුනුම්පතෙහි ඡායා පිටපත්.ජීවතුන් අතර නොමැති නම් මරණ සහතිකයේ පිටපතක්

4.කුලී පදනම මත ලබා ගත්තේ නම්- කුලී ගිවිසුමේ ඡායා පිටපතක් (විධිමත් කුලී ගිවිසුමක් -සාමදාන විනිශ්චයකාර විසින් සනාථ කල) හා අදාල ලිපිනයෙහි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අවසරය දෙන බවට ඉඩම් හිමියාගෙන්ප්‍රකාශය, ඉඩම් හිමියාගේ හැඳුනුම්පතේ පිටපතක්

5.පොදු වෙළඳ සංකීර්ණයේ පිහිටි ස්ථානයක් නම් ප්‍රාදේශීය සභාව හා අයිතිකරු අතර ඇතිකරගත් ගිවිසුම ද අතුරු බදු දීමක් සිදුකර ඇත්නම් ඒ සඳහා අදාල ප්‍රාදේශීය සභාවේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය හා අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය හා ඔහුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත

**07. කාඩ්බෝඩ් ෆයිල් කවරයක් අවශ්‍ය වේ.**

**08.**<u>ව්‍යාපාරය නතර කිරිම.</u>

අදාල අයදුම්පත,ව්‍යාපාරය නතර කළ බවට ග්‍රාම නිලධාරි සහතිකය හා මූල්‍ය බැදීමක් නැති බවට දිවුරුම් ප්‍රකාශය සමග මුල් ව්‍යාපාර නාම ලි.ප.සහතිකය ඉදිරිපත් කළ යුතුය. ග්‍රාම නිලධාරි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.

**09.**සැලකිය යුතුයි:

***අදාළ ග්‍රාම නිලධාරි වාර්තාවේ කපාහැරීම්,මැකීම්,මකන දියර භාවිතා කිරීම් සිදු කර ඇත්නම් ග්‍රාම නිළධාරි විසින් සිය අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතුයි.***

- ❖ **ව්‍යාපාර නාම යෙදීමේදී යම් රටක නමක්, ප්‍රසිද්ධ වෙළඳ නාම ( Common Names ) ,ඓතිහාසික වශයෙන් වැදගත් පුද්ගල නාම/ස්ථාන නාම,සංගමය යන්නභාවිතා කළ නොහැකිය.**
- ❖ **සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පමණක් "ප්‍රයිවට් ලිමිටඩ්" යනුවෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කළ හැකිය.**
- ❖ **"සමාගම " යන්න භාවිතා කරන්නේ නම් එය පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලියාපදිංචි කරගත යුතුය.**

**10.**ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා දැනට අය කරන ගාස්තු

ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය

| | |
|---|---|
| රු.299,999.00 දක්වා කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා | රු.1,500.00 |
| රු.300,000.00 සිට රු.499,999.00 දක්වා ව්‍යාපාර සඳහා | රු.2,500.00 |
| රු.500,000.00 වැඩි ව්‍යාපාර සදහා | රු.3,500.00 |
| එක්දින සේවය සඳහා | රු.5,000.00 |

හවුල් ව්‍යාපාර සඳහා ද මෙම ගාස්තු ක්‍රමය අදාල වේ.

| | |
|---|---|
| ව්‍යාපාර සංශෝධන සඳහා | රු.3,000.00 |
| සත්‍ය පිටපතක් සඳහා | රු.1,500.00 |
| d) ලිපි ගොනුවක් පරීක්ෂා කිරීම සඳහා | රු.500.00 |

e) ව්‍යාපාරය නතර කිරීමේ සහතිකය සඳහා අය කිරීමක් නැත

**11.**<u>දඩ අය කිරීම.</u>

ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමට අයදුම් කරන දිනය, ව්‍යාපාරය ආරම්භ කර ඇති දින සිට මසක කාලයක් ඉක්මවා ඇත්නම් ,ඉක්මවා ඇති සෑම මාසයකටම රු.500/- දඩ මුදලක් ද අය කෙරේ. ව්‍යාපාරය නතර කර මාස 03ක් ඇතුළත දැනුම් දියයුතු අතර එසේ නොමැති විට රු.1000 දඩ මුදලක් අය කෙරේ. **දුරකතන අංකය - 011 2236428**